සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) "අක්කෝධේන ජිනේ කෝධං...." යනාදී ගාථාවෙහි දැක්වෙන පරිදි මසුරුකම් කරන්නා ජයගත යුත්තේ,

(1) ක්‍රෝධ නොකිරීමෙනි. (2) යහපත කිරීමෙනි.

(3) දන් දීමෙනි. (4) සත්‍ය වචනයෙනි.

(02) වේරංජා පුරයේ වස් විසූ කාලයේ බුදුරජාණන් වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලාට

(1) කටුක ආහාර වැළඳීමට සිදුවීය. (2) වර්ෂාවෙන් පීඩා විඳීමට සිදුවීය.

(3) චිංචිමානවිකාව ගේ අපහාස ලැබීමට සිදුවීය. (4) නිදි වර්ජිතව සිටීමට සිදුවීය.

(03) කහවණු කෝටි ගණනක් වටිනා ආරාමයක් තනවා බුදුරජාණන් වහන්සේට පූජා කළේ,

(1) සාමාවතී දේවියයි. (2) යශෝධරා දේවියයි.

(3) විශාඛා සිටු දේවියයි. (4) ඛුජ්ජුත්තරා උපාසිකාවයි.

(04) බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි ගිලනුන්ට උපස්ථාන කරන්නකු තුළ තිබිය යුතු ගුණාංග ගණන,

(1) තුනකි. (2) හතරකි. (3) පහකි. (4) හයකි.

(05) අප බුදුරජාණන් වහන්සේ පැසුළු යම් කිස ආරම්භයේ දී ම,

(1) විශේෂ පුද්ගලයෙකුට හෝ පිරිසකට පිහිටවීමට වැඩියහ.

(2) මහා කරුණා සමාපත්තියට සමවැද ලොව දෙස බැලූහ.

(3) භික්ෂූන් පිරිවරා ජනපද චාරිකාවේ වැඩම කළහ.

(4) භික්ෂූන් වහන්සේලාට චාරිත්‍රානුකූලව කමටහන් දුන්හ.

(06) නව අරහාදී බුදුගුණවල පුරිසදම්මසාරථී ගුණය ලෙස දැක්වෙන්නේ,

(1) අසරණයන්ට පිහිටවීමේ ගුණයයි.

(2) රෝගීන්ට උපස්ථාන කිරීමේ ගුණයයි.

(3) අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණයයි.

(4) නොහික්මුණු පිරිස් හික්මවා ගැනීමේ ගුණයයි.

(07) ස්වාමි දියණියගේ හිංසා පීඩා විඳ දරා ගැනීමට නොහැකිව සියදිවි හානිකර ගැනීමට උත්සාහ ගත්තේ,
(1) සුනීත ය. (2) සෝපාක ය. (3) රජ්ජුමාලා ය. (4) දීඝායු කුමාරයා ය.

(08) බුදුරජාණන් වහන්සේ අංගුලිමාල දමනය කළේ,
(1) කාරුණික වචන වලිනි. (2) තදින් අවවාද කිරීමෙනි.
(3) පිරිස් බලය යෙදවීමෙනි. (4) කොසොල් රජුගේ උපකාරයෙනි.

(09) තමා හා වාද කිරීමට සරිලන අයෙකු මෙතෙක් පහළ වී නැතැයි සිතා උඩගුවෙන් ක්‍රියා කළේ,
(1) සච්චක නම් නිගණ්ඨ පුත්‍රයා ය. (2) කාලසිටු පුත්‍රයා ය.
(3) ආලවක නම් යක්ෂයා ය. (4) උපාලි ගෘහපතියා ය.

(10) අහිංසක ශිෂ්‍යයෙකු වූ සුමුදුට දඩබ්බර ශිෂ්‍යයෙකු වූ කවිඳුගෙන් නිතර හිරිහැර සිදුවිය. එහෙත් සුමුදු හැමවිට ම කවිඳුට කාරුණික වචනයෙන් කථා කළේ ය. නොතේරෙන ගණිත ගැටළු තෝරා දුන්නේ ය. ක්‍රීඩා පිටියේ දී තුවාල වූ විට උපස්ථාන කළේ ය. අවසානයේ කවිඳු සුමුදුගේ හොඳම යහළුවා බවට පත්විය. මෙහිදී සුමුදු ආදර්ශයට ගත්තේ බුදුරජාණන් වහන්සේගේ,
(1) තාදී ගුණයයි. (2) අසරණ සරණ ගුණයයි.
(3) ලෝකවිදූ ගුණයයි. (4) පුරිසදම්ම සාරථී ගුණයයි.

(11) අණන සූත්‍රය හා පත්තකම්ම සූත්‍රය බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,
(1) කොසොල් රජතුමාට ය. (2) විශාඛා සිටු දේවියට ය.
(3) අනේපිඬු සිටුතුමාට ය. (4) සිගාල ගෘහපති පුත්‍රයාට ය.

(12) සුන්දරී පරිබ්‍රාජිකා, මාගන්දියා, චිංචිමානවිකා යන තිදෙනාගේ නම් බෞද්ධ ඉතිහාසයේ සඳහන් වන්නේ,
(1) බෞද්ධ සැදැහැති මහෝපාසිකාවන් ලෙස ය.
(2) බුදුරජාණන් වහන්සේට අපහාස කළ අය ලෙස ය.
(3) බුදුරජාණන් වහන්සේ සමඟ වාද කළ අය ලෙස ය.
(4) බුදුරජාණන් වහන්සේට ප්‍රශංසා කළ අය ලෙස ය.

(13) පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී යනුවෙන් එක් එක් පාරමිතාවන් තුන් වැදෑරුම් වේ. ඒ අනුව අරහත් ඵලය ප්‍රාර්ථනා කරන බෝධි සත්වයන් වහන්සේලා සම්පූර්ණ කරන්නේ,
(1) පාරමී අවස්ථාවයි. (2) උප පාරමී අවස්ථාවයි.
(3) පරමත්ථ පාරමී අවස්ථාවයි. (4) ඉහත අවස්ථා තුනයි.

(14) පාරමිතාවක ඇතුළත් විය යුතු ගුණාංග දෙක වන්නේ,
(1) තණ්හාව හා මානයයි. (2) තණ්හාව හා දෘෂ්ටියයි.
(3) දෘෂ්ටිය හා මානයයි. (4) කරුණාව හා ප්‍රඥාවයි.

(15) සීලය යනු,
(1) කය හික්මවා ගැනීමයි. (2) වචනය හික්මවා ගැනීමයි.
(3) සිත හික්මවා ගැනීමයි. (4) කය වචනය හික්මවා ගැනීමයි.

(16) වණ්ණුපථ ජාතකයෙන් පැහැදිලි වන්නේ,
(1) ප්‍රඥා පාරමිතාවයි. (2) වීර්ය පාරමිතාවයි.
(3) ක්ෂාන්ති පාරමිතාවයි. (4) සත්‍ය පාරමිතාවයි.

(17) ශ්‍රී ලංකාවේ සිංහල දෙමළ මුස්ලිම් ආදී විවිධ ජාතීන්ට අයත් මිනිස්සු සිටිති. මේ ජාතීන් අතර සාමකාමී සහජීවනය ඇතිකර ගැනීම සඳහා ප්‍රබල ලෙස උපකාරී වන ගුණධර්මයන් ඇතුළත් පාරමිතාව වන්නේ,

(1) නෙක්ඛම්ම පාරමිතාවයි. (2) ප්‍රඥා පාරමිතාවයි.
(3) වීර්ය පාරමිතාවයි. (4) මෛත්‍රී පාරමිතාවයි.

(18) බුදු දහමට අනුව සිත රෝගී වන්නේ,

(1) ආහාර නොලැබීම නිසා ය. (2) කෙලෙස් නිසා ය.
(3) විවේකය නැති නිසා ය. (4) කේළාම් නිසා ය.

(19) හිමාලි ප්‍රමාද වී අවදි වෙයි. ප්‍රමාද වී පාසල් යයි. ක්‍රීඩා නොකරයි. ප්‍රබෝධවත් බවින් තොර ය. ඇයට ඉගෙන ගන්නා කිසිවක් මතක නැත. ඉගෙනීමට උනන්දු නැත. ඉහත කරුණු අනුව හිමාලි තුළ බහුලව ඇත්තේ,

(1) කාමච්ඡන්ද නීවරණයයි. (2) ව්‍යාපාද නීවරණයයි.
(3) ථීන මිද්ධ නීවරණයයි. (4) විචිකිච්ඡා නීවරණයයි.

(20) "දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං" යනාදී ගාථාවෙන් ප්‍රකාශ වන්නේ,

(1) දුර ගමන් යන මිනිසුන් ගැන ය. (2) හුදෙකලාව විසීම ගැන ය.
(3) ගල්ගුහාවල ජීවත් වූ අය ගැන ය. (4) මිනිස් සිතේ ස්වභාවය ගැන ය.

(21) බුදු දහමට අනුව සිත දියුණු කර ගැනීම සඳහා

(1) භාවනා කළ යුතු ය. (2) පොත පත කියවිය යුතු ය.
(3) විනෝද විය යුතු ය. (4) හොඳින් උගත යුතු ය.

(22) විසිරී ඇති සිත එක්තැන් කළ හැකි වනුයේ,

(1) දන්දීමෙනි. (2) සිල් රැකීමෙනි.
(3) සමාධිය උපදවා ගැනීමෙනි. (4) බොහෝ නිදා ගැනීමෙනි.

(23) පුද්ගල පාරිශුද්ධිය පිළිබඳ ඉතා වැදගත් ඉගැන්වීමක් ඇතුළත් ධම්මපද ගාථා රත්නය වන්නේ,

(1) ලාභෝ අලාභෝ....... යනාදී ගාථාවයි. (2) අත්තනාව කතං පාපං.... යනාදී ගාථාවයි.
(3) සුජීවං අහිරිකේන.... යනාදී ගාථාවයි. (4) මනුජස්ස සදා සතීමතෝ... යනාදී ගාථාවයි.

(24) වචනයෙන් සිදුවන අකුසලයක් **නොවන්නේ,**

(1) මුසාවාදා ය. (2) ව්‍යාපාදය ය. (3) පිසුනාවාචා ය. (4) පරුෂාවාචා ය.

(25) "කාලා රසමුසු භෝජන කර පෙම්
ගාලා සුවඳැති සඳුනුත් මනරම්......." යනාදී කවිය ඇතුළත් වන්නේ,

(1) ලෝවැඩ සඟරාවේ ය. (2) ගුත්තිල කාව්‍යයේ ය.
(3) සුභාෂිතයේ ය. (4) ලෝකෝපකාරයේ ය.

(26) දීඝජානු කෝලිය පුත්‍රයාට දේශනා කළ මෙලොව දියුණුවට හේතුවන කරුණු සතර අතරින් දැහැමි රැකියා අංශ හයක් පිළිබඳව පෙන්වා දී ඇත්තේ,

(1) උට්ඨාන සම්පදාව පිළිබඳ විස්තරයේ ය. (2) ආරක්ඛ සම්පදාව පිළිබඳ විස්තරයේ ය.
(3) කල්‍යාණ මිත්‍රතාව පිළිබඳ විස්තරයේ ය. (3) සමජීවිකතාව පිළිබඳ විස්තරයේ ය.

(27) සතර සංග්‍රහ වස්තුවලට අයත් නොවන්නේ,
(1) දානයයි. (2) ප්‍රිය වචනයයි. (3) අර්ථචරියාවයි. (4) සමජීවිකතාවයි.

(28) මිහිඳු හිමියන් වැඩම කිරීමට පෙර ලංකාවේ පැවති ආගමික චාරිත්‍රයක් වන්නේ,
(1) වන්දනා ගමන්යාමයි. (2) මළවුන් ඇදහීමයි.
(3) බෝධි වන්දනාවයි. (4) ගිරිභණ්ඩ පූජාවයි.

(29) තෝදෙය්‍ය පුත්‍ර සුභ නම් තරුණයාට බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,
(1) චුල්ලකම්ම විභංග සූත්‍රයයි. (2) මහාකම්ම විභංග සූත්‍රයයි.
(3) සච්ච විභංග සූත්‍රයයි. (4) දක්ඛිණා විභංග සූත්‍රයයි.

(30) ගරු කළ යුත්තන්ට ගරු නොකරන, පිදිය යුත්තන් නොපුදන, අධික මානයෙන් යුත් තැනැත්තා
(1) ප්‍රඥාව අඩුව උපදියි. (2) අල්පේශාක්‍ය ව උපදියි.
(3) දුර්වර්ණව උපදියි. (4) පහත් යැයි සම්මත කුලවල උපදියි.

(31) අනුලෝම පටිච්ච සමුප්පාදයට අනුව තණ්හාව ප්‍රත්‍ය කොටගෙන ඇතිවන්නේ,
(1) ස්පර්ශයයි. (2) වේදනාවයි. (3) උපාදානයයි. (4) භවයයි.

(32) සමාජයේ කලකෝලාහල ඇති වන ආකාරය පටිච්ච සමුප්පාද සිද්ධාන්තයට අනුව පෙන්වා දී ඇත්තේ,
(1) අග්ගිවච්ඡගොත්ත සූත්‍රයේ ය. (2) මහා නිදාන සූත්‍රයේ ය.
(3) සිගාලෝවාද සූත්‍රයේ ය. (4) මහා මංගල සූත්‍රයේ ය.

(33) බුදු සමය මෙරට පැවැති මුල් අවධියේ ම ත්‍රිපිටකය සඳහා හෙළබසින් සම්පාදනය කළ ග්‍රන්ථ හඳුන්වන්නේ,
(1) පාලි අටුවා යනුවෙනි. (2) හෙළටුවා යනුවෙනි.
(3) දම්පියා අටුවා යනුවෙනි. (4) ජාතක අටුවා යනුවෙනි.

(34) පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වන්නේ,
(1) විසිරී තිබූ ධර්ම විනය එක්රැස් කර සම්මුතියකට ගෙන ඒම ය.
(2) අකැප දස වස්තුව ප්‍රතික්ෂේප කිරීම ය.
(3) කථාවත්ථුප්පකරණය රචනා කිරීම ය.
(4) දේශීය හා විදේශීය වශයෙන් ධර්ම ප්‍රචාරය කිරීම ය.

(35) විනය පිටකයට අයත් ග්‍රන්ථයක් හැඳින්වීමේ දී භාවිත කරන පොදු නාමයක් වන්නේ,
(1) "පාලි" යන්න ය. (2) "නිකාය" යන්න ය.
(3) "ප්‍රකරණ" යන්න ය. (4) "විභාෂා" යන්න ය.

(36) දෙවන ධර්ම සංගායනාවෙන් පසු දස වස්තුව පිළිගත් වජ්ජිපුත්තක භික්ෂූන් පිහිටුවා ගත් සංඝ සංවිධානය හැඳින්වෙන්නේ,
(1) ථේරවාද යනුවෙනි. (2) මහා සාංඝික යනුවෙනි.
(3) සම්මිතීය යනුවෙනි. (4) මහිංසාසක යනුවෙනි.

(37) මිහිඳු හිමියන් ලංකාවට වැඩම කළේ ධර්මාශෝක අධිරාජයාගේ,

(1) දහ අට වැනි රාජ්‍ය වර්ෂයේ දී ය.
(2) දහ නව වැනි රාජ්‍ය වර්ෂයේ දී ය.
(3) විසි වැනි රාජ්‍ය වර්ෂයේ දී ය.
(4) විසි එක්වැනි රාජ්‍ය වර්ෂයේ දී ය.

(38) මහින්දාගමනයෙන් නොබෝ දිනෙකින් ලක්දිව ඇතිවූ ථේරවාද බෞද්ධ මධ්‍යස්ථානය වූයේ

(1) අනුරාධපුර මහා විහාරයයි.
(2) අනුරාධපුර ජේතවන විහාරයයි.
(3) අනුරාධපුර අභයගිරි විහාරයයි.
(4) අනුරාධපුර ඉසුරුමුනි විහාරයයි.

(39) මිහිඳු මාහිමියන් ලක්දිව බුදු සසුන පිහිටුවීමෙන් පසු ලාංකික භික්ෂු සමාජයේ පැවිදි වූ ප්‍රථම ලාංකිකයා,

(1) භණ්ඩුක උපාසකයා ය.
(2) මහා අරිට්ඨ කුමරු ය.
(3) මහානාග කුමරු ය.
(4) අසේල කුමරු ය.

(40) දුමින්දාගමනය යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) මිහිඳු හිමියන් වැඩම කිරීමයි.
(2) දළදා වහන්සේ වැඩම කිරීමයි.
(3) පාත්‍රා ධාතුව වැඩම කරවීමයි.
(4) ශ්‍රී මහා බෝධිය වැඩම කරවීමයි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. ලකුණු 20කි.
- 2 සිට 7 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න හතරක් ද තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතු ය. එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් හිමිවේ.

---

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) බුද්ධත්වයට පත්වීමේ සිට සම්බුද්ධ පරිනිර්වාණය දක්වා ගතවූ කාලය වර්ෂ කීය ද?

(ii) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම උදානයෙහි "ගහ කාරක" යනුවෙන් හඳුන්වා ඇත්තේ කුමක් ද?

(iii) වැසිකිළි පරිහරණයේ දී බඳුනේ ජලය ස්වල්පයක් ඉතිරි කිරීම මුල් කොටගෙන කලහකාරී හැසිරීමක් ඇති වූයේ කවර භික්ෂු දෙපිරිසක් අතර ද?

(iv) කායික හා මානසික රෝගාබාධ වැළඳීම දුක්ඛ ආර්ය සත්‍යයෙහි හඳුන්වා ඇත්තේ කිනම් දුකක් ලෙස ද?

(v) "නිබද්ධ චාරිකා" යන්න හඳුන්වන්න.

(vi) ලාභයෙන් උද්දාමයට හෝ අලාභයෙන් අසහනයට හෝ පත් නොවීමේ බුදු ගුණය හැඳින්වෙන්නේ කවර නමකින් ද?

(vii) "දූරංගමං ඒක චරං - අසරීරං ගුහාසයං" මෙම ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(viii) ණය ගැතියකු ණය හිමියාට ඇති බැඳීමට උපමා කර ඇත්තේ කවර නිවරණය ද?

(ix) පෞද්ගලික සම්පතකට හිමිකම් කීමට සෑම පුද්ගලයකුට ම අයිතිය ඇත. මෙම අයිතිය ආරක්ෂා කිරීමට ඉවහල් වන ශික්ෂාපදය ලියන්න.

(x) "මෙය ඇති කල්හි මෙය ඇති වේ. මෙය හට ගැනීමෙන් මෙය හට ගනී" මෙම පටිච්චසමුප්පාද න්‍යාය ඇතුළත් වන පාලි පාඨ දෙක ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) (i) "ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච
නින්දා පසංසා සුඛං ච දුක්ඛං....."
මෙම ගාථාවේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

(ii) එම ගාථාවේ සරල තේරුම ලියන්න. (ලකුණු 03)

(iii) අසහනයෙන් තොරව ජීවත් වීම සඳහා අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණය ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05)

(03) (i) විපස්සනා භාවනාව හඳුන්වන තවත් නම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පඤ්චස්කන්ධයේ "නාම" කොටසට අයත් වන ස්කන්ධ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ශිෂ්‍යයකු වන ඔබට සමථ භාවනාව පුරුදු පුහුණු කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන පෙන්වා දෙන්න. (ලකුණු 05)

(04) (i) බෞද්ධයාගේ අත්පොත වන "ධම්මපදය" අයත් වන්නේ ත්‍රිපිටකයේ කවර පිටකයක කවර නිකාය ග්‍රන්ථයකට ද? (ලකුණු 02)

(ii) "...................................................... වේරං තේසූපසම්මති"
මෙම ගාථවේ මුල් පද තුන සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

(iii) ඔබේ පාසලේ සහෝදර සිසුන් සමඟ මිත්‍රශීලීව ජීවත්වීම සඳහා මෙම ගාථාවෙන් ලබා දෙන උපදේශය කෙතරම් වැදගත් වේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(05) (i) සීලයෙහි විවිධ ප්‍රභේද අතුරින් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ත්‍රිශික්ෂාවෙහි සීල ශික්ෂාවට අයත් අංග තුන ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) වර්තමාන සමාජයෙහි සිදුවන සාරධර්ම පරිහානිය වළක්වා ගැනීම සඳහා සීලය ප්‍රයෝජනවත් වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 05

(06) (i) බුදු පිළිම වහන්සේලා නිර්මාණය වීමට පෙර බුදුරජාණන් වහන්සේ වෙනුවට වන්දනාමාන කිරීම සඳහා උපයෝගී කරගත් පූජනීය වස්තූන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) බුද්ධ ප්‍රතිමා වහන්සේලා ප්‍රධාන වශයෙන් වර්ග තුනකට බෙදා දැක්විය හැකි ය. එම වර්ග තුන ලියන්න. (ලකුණු 03)

(iii) බෞද්ධ කලා ශිල්ප රැකගැනීමේ වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 05)

(07) පහත ඒවායින් මාතෘකා දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ (ලකුණු 05)

(ii) සතර සංග්‍රහ වස්තු (ලකුණු 05)

(iii) ධම්මපදය (ලකුණු 05)

(iv) අලුවිහාර සංගායනාව (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් අධ්‍යාපන
Department of Education - Western Province Department of Education

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

පිළිතුරු පත්‍රය
Marking Scheme

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 3 | (11) | 3 | (21) | 1 | (31) | 3 |
| (02) | 1 | (12) | 2 | (22) | 3 | (32) | 2 |
| (03) | 3 | (13) | 1 | (23) | 2 | (33) | 2 |
| (04) | 3 | (14) | 4 | (24) | 2 | (34) | 1 |
| (05) | 2 | (15) | 4 | (25) | 1 | (35) | 1 |
| (06) | 4 | (16) | 2 | (26) | 1 | (36) | 2 |
| (07) | 3 | (17) | 4 | (27) | 4 | (37) | 1 |
| (08) | 1 | (18) | 2 | (28) | 2 | (38) | 1 |
| (09) | 1 | (19) | 3 | (29) | 1 | (39) | 2 |
| (10) | 4 | (20) | 4 | (30) | 4 | (40) | 4 |

(ලකුණු 01 x 40 = 40)

## II පත්‍රය

(01) (i) වසර 45 කි.

(ii) තණ්හාව නැමැති වඩුවා

(iii) ධර්මධර හා විනයධර භික්ෂු දෙපිරිස අතර

(iv) ව්‍යාධි දුක

(v) අසරණ පිරිස් සොයා වැඩමකොට පිහිටවීම (විශේෂයෙන් වඩින ගමන)

(vi) තාදී ගුණය

(vii) "යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති
මොක්ඛන්ති මාර බන්ධනා"

(viii) කාමච්ඡන්ද නීවරණය

(ix) අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි (නොදුන් දෙය ගැනීමෙන් / සොරකමින් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.)

(x) "ඉමස්මිං සති ඉදං හෝති
ඉමස්ස උප්පාද ඉදං උප්පජ්ජති

(02) (i) ඒතේ අනිච්චා මනුජේසු ධම්මා
අසස්සතා විපරිණාම ධම්මා (ලකුණු 02)

(ii) ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, සැප, දුක යන මේ දහම් මිනිසුන් කෙරෙහි අනිත්‍යයි. ස්ථිර නොවේ. විපරිනාම ස්වභාවයෙන් පවතී. (ලකුණු 03)

(iii) ලාභ, යස, ප්‍රශංසා සැප හමුවේ උමතු වීම මානයට පත්වීම ද අලාභ අයස නින්දා දුක් හමුවේ දුකට ශෝකයට පත්වීම ද අසහනකාරී ජීවිතයකට හේතුවන බවත් ඉන් මිදීම ප්‍රීතිදායක දියුණුවන ජීවිතයකට හේතුවන බවත් දක්වා තිබිය යුතු ය. (ලකුණු 05)

(03) (i) විදර්ශනා / ප්‍රඥා / ත්‍රිලක්ෂණ (ලකුණු 02)

(ii) වේදනා / සඤ්ඤා / සංඛාර / විඤ්ඤාණ (ලකුණු 03)

(iii) 11 ශ්‍රේණිය 04 පාඩමේ 38 පිටුවේ දැක්වෙන සමථ භාවනාවේ ශිෂ්‍යයින් සඳහා වන ප්‍රයෝජන ඇසුරෙන් පිළිතුරු සකස්වී තිබිය යුතු ය. (ලකුණු 05)

(04) (i) සූත්‍ර පිටකය, ඛුද්දක නිකාය (ලකුණු 02)

(ii) "අක්කොච්ඡිමං අවධි මං
අජිනි මං අහාසි මේ
යේ තං න උපනයිහන්ති
වේරං තේසූපසම්මති" (ලකුණු 03)

(iii) පාසලේ මිතුරන් අතර ඇතිවන සුළු සුළු ගැටුම් හමුවේ වෛර සිතුවිලි සිත තුළ ඇතිවීමට ඉඩ නොදී මිතුරු බවට හානි නොකර ගැනීමෙන් කටයුතු කිරීමට මෙම ගාථාවෙන් වටිනා උපදෙස් ලබා දෙන බව සාකච්ඡා කොට තිබිය යුතු ය. (ලකුණු 05)

(05) (i) ප්‍රධාන ප්‍රභේද දෙක ලෙස චාරිත්‍ර ශීලය - වාරිත්‍ර ශීලය හෝ
ගිහිසිල්, පැවිදි සිල් ලෙස හෝ
සිල්පද ගණන අනුව පන්සිල් , ආජීවාෂ්ටමක ශීලය. අටසිල්, ගිහි දසසිල් (ලකුණු 02)

(ii) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව (ලකුණු 03)

(iii) වත්මන් සමාජයේ පංච දුශ්චරිත, දස අකුසල් බහුලව සිදුවීමෙන් විශාල සාරධර්ම පරිහානියක් දක්නට ලැබේ. මෙම තත්වය වලක්වා ගැනීම සඳහා ශීලය යොදාගත හැකි ආකාරය විස්තර කොට තිබිය යුතු ය. (ලකුණු 05)

(06) (i) බෝධීන් වහන්සේ, වජ්‍රාසනය, පද්මය, සිරිපතුල, ධර්ම චක්‍රය, ස්තූපය (ලකුණු 02)

(ii) හිටි පිළිම, හිඳි පිළිම, සැතපෙන පිළිම හෙවත් ඔත් පිළිම (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකික බෞද්ධ සංස්කෘතික අනන්‍යතාව රැක ගැනීම සඳහාත් පරපුරෙන් පරපුරට සංස්කෘතිය පවරා දීම සඳහාත් ශ්‍රද්ධාව දියුණු කිරීම සඳහාත් නිවන් අරමුණු තීව්‍ර කිරීම සඳහාත් බෞද්ධ කලාශිල්ප රැක ගැනීමේ වැදගත්කම සාකච්ඡා කොට තිබිය යුතු ය.
(ලකුණු 05)

(07) (i) සිට (iv) දක්වා තෝරාගත් මාතෘකා දෙකක් සඳහා ප්‍රමාණවත් පිළිතුර බැගින් ලියා ඇතිවිට එක් පිළිතුරකට ලකුණු 05 බැගින් ලකුණු 10ක් දෙන්න.